# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 6 ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

# අක්ෂරමාලාව හා පිල්ලම්

පාඩම හොඳින් කියවා පහත අභ්‍යාසවලට පිළිතුරු සපයන්න.

**01.** **හිස්තැනට වඩාත් සුදුසු වචනය කොටුව තුළින් තෝරා ලියන්න.**

I කතා කිරීමේ දී මුවින් පිට කරන ශබ්ද ලියා දැක්වීම සඳහා භාවිත කරන සංකේත ______________ නම් වේ.
II එක් භාෂාවකට අයත් අකුරු සියල්ල එකතු වූ විට එය ______________ යනුවෙන් හඳුන්වයි.
III හෝඩියට කියන තවත් නමක් නම් ______________ යි.
IV නූතන සිංහල අක්ෂර මාලාවේ මුළු අකුරු ගණන ______________ වේ.
V නූතන සිංහල හෝඩියේ ______________ 18 කි.

| ස්වර අකුරු | අක්ෂර | වර්ණ මාලාව | හැටක් | හෝඩිය |
|---|---|---|---|---|

**02.** **නිවැරදි පිළිතුර තෝරන්න**

I නූතන සිංහල හෝඩිය ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. එනම්,

(අ) ස්වර අක්ෂර හා ව්‍යඤ්ජන අක්ෂර
(ආ) අල්පප්‍රාණ අක්ෂර හා මහාප්‍රාණ අක්ෂර
(ඇ) ස්වර අක්ෂර හා සඤ්ඤක අක්ෂර
(ඈ) මහාප්‍රාණ අක්ෂර හා සඤ්ඤක අක්ෂර

II වර්තමාන සිංහල හෝඩියේ ව්‍යඤ්ජන අක්ෂර ගණන _______

(අ) 20 කි.
(ආ) 32 කි.
(ඇ) 42 කි.
(ඈ) 38කි.

III ස්වර හා ව්‍යඤ්ජන අක්ෂර නිවැරදි ව වෙන් කර ලියා ඇති වචනය වනුයේ,

(අ) ඔ+ර්+රු+ව්+අ
(ආ) උ+ද්+ඇ+ල්+ල්+අ
(ඇ) ක්+අ+ත්+අ+ර් +ග්+ම
(ඈ) ජ්+අ+න්+ස+ල්+අ

IV තනිව උච්චාරණය කළ හැකි අක්ෂර _______ නම් වේ.

(අ) සඤ්ඤක අක්ෂර
(ආ) මහාප්‍රාණ අක්ෂර
(ඇ) ව්‍යඤ්ජන අක්ෂර
(ඈ) ස්වර අක්ෂර

අන්තගර්තය : ඩබ්.ජී.ඒ.සී.දිල්හානි මිය, වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව
සැකසුම : එස්.ඒ.ආර්.එල්.සමරතුංග, ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක.බලංගොඩ

Copyright©www.e-thaksalawa.moe.gov.lk

V ව්‍යඤ්ජන අක්ෂවලට අයත් වුව ද හල් ස්වරූපයෙන් නො පවතින අක්ෂරයක් වනුයේ,

(අ) ම
(ආ) ස
(ඇ) හ
(ඈ) ක

**03. 'අ' තීරුවේ දක්වා ඇති පිල්ලම් නාමය ඇතුළත් වචනය 'ආ' තීරුවෙන් තෝරා යා කරන්න.**

| අ | ආ |
|---|---|
| ඇලපිල්ල | දෛවය |
| කෙටි ඉස්පිල්ල | පේර |
| දිගු පාපිල්ල | කාලය |
| කොම්බුව හා හල් ලකුණ | කිතුල් |
| කොම්බු දෙක | කුඹියා |

**04.** හිස්තැනට ගැළපෙන අක්ෂරය වරහන් තුළින් තෝරන්න

I ප්‍ර _ල (බ/භ)
II වර්_නය (ධ/ද)
III ප්‍රමු_ (ක/ඛ)
IV ග්‍රන්_ය (ත/ථ)
V සමස්_ (ත/ථ)

අන්තගර්තය : ඩබ්.ජී.ඒ.සී.දිල්හානි මිය, වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව
සැකසුම : එස්.ඒ.ආර්.එල්.සමරතුංග, ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක.බලංගොඩ

Copyright©www.e-thaksalawa.moe.gov.lk